# සමාජානුයෝජනය හා ගුරු භූමිකාව

මඩුගල්ලේ සුදත්ත හිමි

## හැඳින්වීම

මෙලොවට බිහි වන කුඩා බිළිඳා හැඬීම පමණක් සන්නිවේදනය කර ගත් කිසිවක් කර ගැනීමට හෝ කියා ගැනීමට නො හැකි ව අසරණ වූවෙකි. එය මානව වර්ගයාට පමණක් නො ව අණ්ඩජ (බිජුවකින් උපන්) හා ජලාබුජ (මව් කුසකින් උපන්) සියලු සත්ත්වයින්ට ම සාධාරණ ය. මෙම හේතුව නිසා මෙලොවට බිහි වන සත්ත්වයා ඒ ඒ ජාතීන්ට අනුව හැඩ ගැස්වීම ඔවුන්ගේ පැවැත්ම පිණිස සිදු කළ යුත්තකි. සමාජානුයෝජනය යනු එලෙස මිනිසා ඇතුළු ඒ ඒ සත්ත්වයින්ගේ හැසිරීම් රටාවලට අනුව හැඩ ගස්වා ගැනීම වන අතර මිනිසාට පමණක් සීමා වූ හැඩ ගැස්වීම මානවීයකරණය යනුවෙන් හඳුන්වයි.

එලෙස මෙලොව එළිය දකින බිළිඳා මානව සමාජයට අනුව හැඩ ගස්වා ගැනීම විවිධ ක්‍රම හරහා සිදු වේ. බිළිඳා උපන් විගස අයත් වන පවුල නම් සමාජ කාරකය තුළින් ප්‍රාථමික සමාජානුයෝජනය සිදු වන අතර පවුලින් පිටත දී එනම් පාසල, සම වයස් කණ්ඩායම්, යහළුවන්, වැඩිහිටියන්, විවිධ සමිති සමාගම් ආදිය මගින් ද්විතීයක සමාජානුයෝජනය සිදු වේ. මෙලෙසින් සිදු වන සමාජානුයෝජනයේ දී විශේෂ අවස්ථාවක් ලෙසට පාසල දැක්විය හැකි ය.

අවිධිමත් අයුරින් පවුලෙන් අධ්‍යාපනය ලද දරුවා වයස අවුරුදු 5ක් පමණ වන විට පාසලට ඇතුළත් කරන අතර එහි දී විධිමත් ආකාරයෙන් අධ්‍යාපනය ලබා දීම සිදු වේ. එහි දී දෙමාපිය ඇසුරින් මිදෙන දරුවා ගුරුවරුන්ගේ සමීපයේ වයස අවුරුදු 16 වන තෙක් නිත්‍ය වශයෙන් ම රැඳී සිටී. එහි දී දරුවා නො දන්නා සමාජයට හා ලෝකයට හුරු කිරීමේ වගකීම ගුරුවරයා සතු වේ. ඒ අනුව මෙම ලිපියේ දී මූලික ව දරුවෙකු සමාජානුයොජනය කිරීම සඳහා ගුරුවරයාගේ භූමිකාව කවරාකාර ද යන්න විමසා බැලීමට අපේක්ෂිත ය.

## සමාජානුයෝජනය නිර්වචනය

සමාජීයකරණය, අනුසංස්කෘත්‍යායනය, සමාජගත වීම යන නම්වලින් ද හැඳින්වෙන සමාජානුයෝජනය (Socialization) යන්න 'සමාජ+අනුයෝජනය' යන පද ද්වය එකතු වීමෙන් සැකසී ඇති අතර එහි පදගතාර්ථය වන්නේ සමාජයට අනුව හැඩ ගැසීම හෙවත් සමාජයට අනුගත කිරීමයි. එය මානව වර්ගයාට පමණක් සීමා වූවක් නො ව සියලු සත්ත්වයින්ට ම සාධාරණ වූවකි.

මිනිස් දරුවකු ලොවට බිහි වන්නේ සමාජ සත්ත්වයකු ලෙස නොව, ජීව විද්‍යාත්මක (Biological) ඓන්ද්‍රියකු වශයෙනි. පුද්ගලයෙකුට උපයුක්ත කර ගත හැකි චර්යාධර්ම, සිරිත් විරිත්, සම්ප්‍රදාය හා පිළිවෙළ රටා ආදිය සමාජය තුළ නිරතුරු ව හට ගනී. සමාජයේ ම නැති වී නැවත නැවතත් ඇති වේ. මෙම අඛණ්ඩ සමාජ ක්‍රියාකාරිත්වය හමුවේ පුද්ගල හැඩ ගැස්ම ද වේගයෙන් සිදුවන අතර එහි දී පුද්ගලයා සමාජයට අනුව හැඩ ගැසී සමාජ සත්ත්වයකු ලෙස තම පැවැත්ම තහවුරු කර ගනී. එම ක්‍රියාවලිය සමාජානුයෝජනය ලෙස සමාජ විද්‍යාඥයෝ හඳුන්වති. පුද්ගලයා සිය ජීවිත කාලය පුරාවට ම මෙම ක්‍රියාවලියට යටත් වන අතර ජීවියෙකු වශයෙන් මිනිසාගේ කායික, මානසික සන්දර්භය සමාජානුයෝජන ක්‍රියාවලියට යටත් වීමට අවශ්‍ය හැකියාව එම තැනැත්තාට ලබා දෙයි. නිදසුන් ලෙස බිය, නින්ද, කුසගින්න, පිපාසය, වැනි ප්‍රේරණ නෛසර්ගික වශයෙන් ළදරුවා තුළ පැවතීම, අවධානයට යොමු වීමේ දැඩි ආශාවක් තිබීම, තම අවශ්‍යතා පෙන්වා දීම සඳහා යම් සන්නිවේදන ශක්තියක් පිහිටා තිබීම ආදිය දැක්විය හැකි ය. මෙබඳු සාධක නිසා ඔහු නිරායාසයෙන් ම සමාජානුයෝජන ක්‍රියාවලියට යටත් වෙයි. ඒ අනුව ජීවවිද්‍යාත්මක මිනිසා සමාජීය සත්ත්වයකු කරනු ලබන ක්‍රියාවලිය සමාජානුයෝජනය ලෙස හඳුන්වා දිය හැකි ය. මේ පිළිබඳ විවිධ සමාජ විද්‍යාඥයින් දක්වා ඇති අදහස් විමසා බැලීමෙන් එය වඩාත් පැහැදිලි වේ.

ප්‍රකට සමාජවිද්‍යාඥයෙකු වන ගිඩන්ස් (Giddens) දක්වන්නේ සමාජයේ පවතින දැනුම් සම්භාරයන් ඉගෙන තනිව ජීවත් වීමට හැකි වන ලෙස හැඩ ගැසීම සමාජානුයෝජනය බවයි.

'සමාජානුයෝජනය යනු පිළිසරණක් නොමැති දරුවා ඔහු හෝ ඇය ඉපදුණු සංස්කෘතියේ පිළිවෙත් පිළිබඳ කුසලතා ලැබ ස්ව සම්ප්‍රජානන හා දැනුම ඇති පුද්ගලයෙකු බවට පත්වන ක්‍රියාවලියයි' (එස් ගලගමගේ, 2019: 23).

ඒ අනුව මානව වර්ගයා තම ජීවිතයට අදාළ වන හා ජීවිතය පහසු කරවන චර්යා ධර්ම රාශියක් පිළිගෙන එය පරම්පරාවෙන් පරම්පරාවට ආරක්ෂා කරමින් අනෙක් පරම්පරාවට සම්ප්‍රේෂණය කරනු ලබයි. උක්ත නිර්වචනය අනුව පැහැදිලි වන්නේ එවැනි පිළිගත් මත පසු පරම්පරාවට පවරා දීම සමාජානුයෝජනය බවයි. ඒ හා සමාන අර්ථයකින් ජෝර්ජ් හර්බට් මීඩ් (George Herbert Mead) ද සමාජානුයෝජනය පහත පරිදි නිර්වචනය කර ඇත.

''දෙමාපියන් පිළිගත් ධර්මතාවන් අගනාකම් හා ආකල්ප දරුවන් විසින් මනෝගමනය කර ගෙන සුපහන් සිතක් තනා ගැනීමේ ක්‍රියාවලියයි'' (F. Elkin, 1960: 102).

ඒ හා සමාන අදහසක් දෙන සමාජ ධර්මතාවලට අනුව හැඩ ගැසීම සමාජානුයෝජනය ලෙසින් ඩබ්.එෆ්. ඔග්බම් (W.F. Ogbum) සඳහන් කරයි.

සමාජ සමූහයේ ධර්මතාවලට අනුකූලව ජීවත් වීමට පුද්ගලයා ඉගෙන ගන්නේ සමාජානුයෝජන ක්‍රියාවලියෙනි (නාගිත හිමි, 1998: 103).

ඒ අනුව සමාජයේ පවතින සම්ප්‍රදාය, නීතිරීති, ආකල්ප ආදි සියල්ලට අනුකූල වන ලෙස හැසිරීමට ඉගෙන ගැනීම හා ඒවා තමන්ගේ චර්යාමය ලක්ෂණ ලෙසින් ගොඩනංවා ගැනීම සමාජානුයෝජනය ලෙස හඳුන්වයි.

සමාජයේ සිටින අනෙක් පුද්ගලයන් සමග සුහද ව කටයුතු කිරීමේ හැකියාව ගොඩ නැංවීම සඳහා එහි ඇති අගයන් පුද්ගලයාට ලබා දීම සමාජානුයෝජනය බව සෙකාඩ් සහ බැක්මන් (Secord and Backman) දක්වති (ගලගමගේ, 2019: 24).

මේ අනුව සමාජානුයෝජනය යනු මානව වර්ගයාගේ පැවැත්ම පිණිස සමාජයට අනුව හැඩ ගස්වා ගැනීමයි. එනම් සමාජයේ පවතින නීතිරීති, සාරධර්ම, අගයන්, ආකල්ප ආදිය අනුව හැඩ ගස්වා ගැනීම යි. ඉහත තොරතුරුවලට අනුව සමාජානුයෝජනය ක්‍රියාවලියක් බව වටහා ගත හැකි ය. එහි ගතික ක්‍රියාවලියක් වීම, සංකීර්ණ ක්‍රියාවලියක් වීම, අඛණ්ඩ ක්‍රියාවලියක් වීම ආදි ලක්ෂණ දැකිය හැකි ය.

එමෙන් ම සමාජානුයෝජන ක්‍රියාවලියේ මූලික නීති 04ක් විද්‍යමාන ව පවතින බව ඒ පිළිබඳ ආනුභවික අධ්‍යයනවල නියැලී සිටින සමාජවිද්‍යාඥයන් විසින් පෙන්වා දී ඇත. එනම්,

I. පුද්ගලයා සමූහයේ මූලික නීති උගත යුතු ය.

II. සමාජයේ-සමූහයේ පිළිගත් සම්මතයන්ට හැම විට ම අනුගත විය යුතු ය.


III. සංස්කෘතියට අත්‍යවශ්‍ය වූ ශිල්පීය ක්‍රම පිළිබඳ උගැන්මක් ලබා ගත යුතු ය.

IV. පුද්ගලයා තමාට හිමි කාර්ය කොටස කුමක්දැ'යි නිශ්චිත ව දැනගත යුතු ය (Francis, 1961: 153).

ආදි වශයෙනි. ඒ අනුව සමාජානුයෝජනය, පුද්ගලයා තමන් අයත් සමාජයට හුරු පුරුදු කරවන ක්‍රියාවලියක් ලෙස නැති නම් ජීවවිද්‍යාත්මක ව උපන් සත්ත්වයා සාමාජික සත්ත්වයකු කරන ක්‍රියාවලියක් ලෙස හඳුන්වා දිය හැකි ය.

**ගුරු භූමිකාව නිර්වචනය**

සමාජානුයෝජනයේ දී ප්‍රධාන සමාජානුයෝජන කාරකයක් ලෙස පාසල දැක්විය හැකි ය. පාසල තුළ මූලික ව සිදු කරනුයේ සමාජයට ගැළපෙන පුද්ගලයෙකු සැකසීම යි. එනම් සමාජානුයෝජනය කිරීමයි. පාසල තුළ සිදු වන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියෙන් එය ඉටු වීම දැකිය හැකි ය. එහි 1 වන රූපය අනුව ප්‍රධාන විචල්‍ය 3කි (ජයසේන, 2002: 11).




ඒ අතරින් ප්‍රධාන විචල්‍යයක් ලෙස ගුරුවරයා දැක්විය හැකි ය. පාසල තුළ ශිෂ්‍යයා මෙහෙය වීමේ වගකීම හා ඉගැන්වීමේ වගකීම පැවරෙනුයේ ගුරුවරයාට නිසා පාසලේ ප්‍රධාන විචල්‍යයක් ලෙස ගුරුවරයා දැක්විය හැකි ය. එම නිලතලය උදෙසා පැවරෙන වගකීම්, යුතුකම් සමුදාය ගුරු භූමිකාව ලෙස දැක්විය හැකි ය.

භූමිකාව යනු තමාට ඉටු කිරීමට ඇති කාර්ය යි. 'සමාජයේ යම්කිසි මට්ටමකට හෝ තලයකට ගැළපේ යැයි සමාජය විසින් ම පිළිගනු ලබන හැසිරීම් රටා භූමිකාව වේ' (සේනාධීර හා වනසිංහ, 2005: 96). එහි දී ගුරුවරයාට පැවරෙන වගකීම්, යුතුකම්, බලතල, හැසිරීම් රටා සියල්ල ගුරු භූමිකාව ලෙස අර්ථවත් වේ. එය පහත දැක්වෙන නිර්වචනයෙන් ද පැහැදිලි වේ.

'භූමිකාව යනු කිසියම් තත්ත්වයක, සේවයක හෝ වෘත්තියක යෙදී සිටින පුද්ගලයෙකුගේ වගකීම්, බලතල මෙන්ම යුතුකම් හා පැවතුම් යන සංකල්පයන්හි අන්තර් ක්‍රියාවලියකි' (එස් ගලගමගේ, 2019: 247).

ඒ අනුව යම් පුද්ගලයෙක් කිසියම් වෘත්තියක නියැළී සිටින විට දී ඔහුගෙන් බලාපොරොත්තු වන කාර්යයන් එම තනතුරේ භූමිකාව වන අතර එම තනතුර සඳහා වෙනත් පුද්ගලයෙකු පත් වුව හොත් ඔහු සඳහා ද එම තනතුරේ හෝ නිලයේ කාර්යභාරය පැවරේ. ඒ අනුව භූමිකාව යනු යම්කිසි තනතුරක දී ඔහුගෙන් බලාපොරොත්තු වන කාර්යභාරය යි.

ඉගැන්වීම් කාර්යයෙහි නිරත වන පුද්ගලයාට පැවරී ඇති පුළුල් වූ කාර්යභාරය ගුරු භූමිකාව ලෙස හැඳින්වේ (ගලගමගේ, 2019: 247). ඒ අනුව පාසලේ දී සහ පාසලින් පිටත දී ගුරුවරයෙකු ලෙස පැවරෙන වගකීම්, යුතුකම්, බලතල සියල්ල ගුරු භූමිකාවට අයත් වේ. එලෙස ම ගුරු භූමිකාව තීරණය කිරීමෙහි ලා ශිෂ්‍ය අපේක්ෂණ, දෙමාපිය අපේක්ෂණ, පරිපාලන අපේක්ෂණ, රජයේ අපේක්ෂණ, සමාජ අපේක්ෂණ, ජගත් සංවිධාන අපේක්ෂණ බලපායි (ගලගමගේ, 2019: 251, 252). ගුරුවරයාගෙන් යම් දෙයක් යමෙක් බලාපොරොත්තු වන්නේ නම් ඒ සියල්ල ගුරු භූමිකාවට අදාළ වේ.

එමෙන් ම 1974 දී පවත්වන ලද පොදු රාජ්‍ය මණ්ඩලීය සමුළුවේ දී ගුරුවරයාගේ භූමිකාව ප්‍රධාන කොටස් දෙකක් ලෙස වර්ග කර දක්වන ලදි.

- සමාජ පද්ධතිය විනාශ වීමට නො දී රැක බලා ගැනීම
- සමාජ පද්ධතිය නවීකරණය කිරීම (සේනාධීර හා වනසිංහ, 2005: 97)

මේ අනුව පැහැදිලි වන්නේ සමාජයට ඔබින පුද්ගලයෙකු බිහි කිරීමේ එනම් පුද්ගලයෙකු සමාජානුයෝජනය කිරීමේ වගකීම ගුරුවරයා සතු වන බව යි.

**ගුරුවරයා හා සමාජානුයෝජනය අතර සබැඳියාව**

ගුරුවරයා හා සමාජානුයෝජනය අතර මනා සම්බන්ධයක් පවතී. එයට හේතුව අධ්‍යාපනය යනු සමාජානුයෝජන ක්‍රියාවලියක් වීමයි. සමස්ථ අධ්‍යාපන ක්‍රියාවලියෙන් සිදු කරනුයේ සමාජයේ, රටේ, ලෝකයේ වැඩ බිමට උචිත වන ආකාරයේ පුද්ගලයෙකු බිහි කිරීමයි. ඒ සඳහා මූලිකත්වය ගනුයේ පාසල යි. මුලින් සඳහන් කළ ආකාරයෙන් පාසලේ ගුරු, සිසු, විෂයමාලාව ලෙසින් ප්‍රධාන විචල්‍ය 3ක් පවතින අතර සමාජානුයෝජනය විෂයෙහි ගුරුවරයා එහි ප්‍රධාන භූමිකාව නියෝජනය කරයි.

ජෛවීයයෙකු ලෙසින් මෙලොව බිහි වන කුඩා දරුවා මව්පියන්ගෙන් සමන්විත වූ පවුලෙන් අවුරුදු 5ක් පමණ සමාජයට

අනුගත වෙමින් සිට, පවුල තුළින් මිදී පාසලට යොමු වී එහි පවත්නා නීතිරීති, සිරිත් විරිත් මෙන් ම විවිධ ආයතන සමග අන්තර් සබඳතා පැවැත්වීමට අවශ්‍ය පුහුණුව, දැනුම ලබා ගෙන සමාජයේ තනි ව කටයුතු කළ හැකි පුද්ගලයෙකු බවට පත් වනුයේ පාසලේ ගුරුවරුන්ගේ මැදිහත්වීම හා මග පෙන්වීමෙනි. සුප්‍රකට මනෝවිද්‍යාඥයකු වූ පියාජේ දක්වනුයේ, 'පවුල හා සමාජය අතර අන්තර් මාධ්‍ය මධ්‍යස්ථානයක් ලෙස පාසල, පුද්ගලයා සමාජයට අනුයෝජනය වූ උදාර පුරවැසියෙකු බිහි කරයි' (අමරසේකර, 1996: 75) යනුවෙනි. පවුලෙන් මිදෙන දරුවාට පාසල තුළින් සමාජයේ පවත්නා සමාජ ධර්මතා හා ප්‍රතිමාන උගන්වා පුද්ගල ස්වීයත්වය හා පෞරුෂත්වය ගොඩ නැඟීමෙන් සමාජ සදාචාර සංවර්ධනය හා ඒකාබද්ධතාව ඇති කරවන බව පැහැදිලි වේ. ඒ අනුව පාසල් කාලය තුළ ගුරුවරු ශිෂ්‍යයින් සමාජයට උචිත වැඩදායී පුද්ගලයන් බවට පත් කරනු ලබති. එය පැහැදිලි කරන එස්. ගලගමගේ ගුරු භූමිකාව සම්බන්ධ ප්‍රධාන වගකීම් අංශ දෙකකට වෙන් කර ඇත.

- ඉගැන්වීම, සමාජානුයෝජනය, ඇගයීම සම්බන්ධ කාර්යභාරය
- ශිෂ්‍යයින් අධ්‍යාපනයට පෙලඹවීම, පාලනය, විනය ගරුක කිරීම, ගුරුවරයාට පැවරෙන වගකීම් වේ (ගලගමගේ, 2019: 254).

ඒ අනුව සමස්ත අධ්‍යාපන ක්‍රියාවලිය ම සමාජානුයෝජනය කිරීමක් වුව ද, ගුරු භූමිකාවේ සමාජානුයෝජනය වෙන ම කාර්යභාරයක් ලෙසින් වෙන් කර ඇත.

ගුරුවරයාගේ ප්‍රධාන කාර්යභාරය යුනෙස්කෝ සංවිධානය 1968 දී මෙසේ දක්වයි. 'ගුරුවරයා තමා සතු දැනුම, ආකල්ප, කුසලතා අන් අය සමග හුවමාරු කර ගැනීම වැදගත් කොට තර්කානුකූලව සිතන පුද්ගලයෙකි' (සේනාධීර හා හේවාපතිරණ, 2006: 33) යනුවෙන් දැක්වෙන පරිදි ගුරුවරයා සතු දැනුම, කුසලතා හා ආකල්ප ශිෂ්‍යයාට ලබා දීමෙන් ශිෂ්‍යයා සමාජානුයෝජනය කිරීමේ වගකීම ගුරුවරයාට පැවරේ. එහෙයින් ගුරුවරයා ශිෂ්‍ය සමාජානුයෝජනයට නිතැතින් ම පාසලේ දී සම්බන්ධ වේ.

කුක් (Cook) සඳහන් කරන ආකාරයට 'සමාජානුයෝජනය යනු පුද්ගලයෙකු අධ්‍යාපන ක්‍රියාවලියෙන් සමාජයේ විවිධ භූමිකාවන් සහ වෙනත් සංස්කෘතිකාංග ඉගෙන ගැනීමයි.' මෙයින් අර්ථවත් වන්නේ ද අධ්‍යාපන ක්‍රියාවලියෙන් ශිෂ්‍යයා සමාජයට ඔබින පුද්ගලයෙකු බවට පත් කිරීම යි. එම නිසා අධ්‍යාපන ක්‍රියාවලියේ ප්‍රධාන නියමුවා වන ගුරුවරයා විසින් තම ශිෂ්‍යයන් සමාජයට අනුව හැඩ ගසනු ලබයි. ඒ අනුව ශිෂ්‍යයා සමාජානුයෝජනය කිරීමේ ප්‍රධානත්වය ගුරුවරයා විසින් ගෙන ඇති බව පැහැදිලි වේ.

අධ්‍යාපනයෙන් ප්‍රධාන වශයෙන් අවස්ථා 3ක දී ශිෂ්‍ය සමාජානුයෝජන ක්‍රියාවලියට ගුරුවරයා සම්බන්ධ වේ. එනම්,

- ප්‍රාථමික අධ්‍යාපනය
- ද්විතීයික අධ්‍යාපනය
- තෘතීයික අධ්‍යාපනය

යන මෙම අවස්ථා තුනේ දී ම ශිෂ්‍යයා සමග ගුරුවරයා සම්බන්ධ වේ. ප්‍රාථමික අධ්‍යාපන ආයතන මගින් එතෙක් පවුල සමග තිබූ බැඳීම මදක් දුරස් කරමින් සමවයස් කණ්ඩායමක් තුළ අනන්‍යතාව ඇති කර ගැනීමට හුරු පුරුදු කරයි. එහිදී ආහාර පුරුදු, ඇඳුම් පැළඳුම්, පිරිසිදුකම්, ඥාතීන් හැඳින ගැනීම හා නීති රීති පිළිබඳ ව හුරු කිරීම සිදු වේ. ද්විතීයක අධ්‍යාපනය මගින් විෂය මූලික හා සමාජ මූලික දැනුවත් භාවය ලබා දීමෙන් පෞරුෂත්වය සංවර්ධනය කරයි. තෘතීයික අධ්‍යාපනයෙන් එනම්, විශ්වවිද්‍යාල, කාර්මික ආයතන ආදියෙන් පුද්ගලයා සුවිශේෂ වූ චර්යා රටාවන්ට හුරු කරවයි. මෙම අවස්ථා තුනේ දී ප්‍රාථමික හා ද්විතීයක අධ්‍යාපනය තුළ සියලු කාර්යවල දී මූලිකත්වය දී කටයුතු කරනුයේ ගුරුවරයා ය. ඒ අනුව ගුරුවරයා ශිෂ්‍යයා සමාජානුයෝජනය කිරීමේ ක්‍රියාවලියේ ප්‍රමුඛත්වය ගෙන කටයුතු කරන බව පැහැදිලි වේ.

මේ අනුව පැහැදිලි වනුයේ අධ්‍යාපනය යනු සමාජානුයෝජන ක්‍රියාවලියක් බවත් එහි ප්‍රධාන භූමිකාව ගුරුවරයා විසින් මෙහෙයවන බවත් ය. එයට හේතුව වනුයේ අධ්‍යාපන ආයතනය තුළ ශිෂ්‍යයින්

මෙහෙයවීමේ කාර්යයෙහි නියුක්ත වී සිටිනුයේ ගුරුවරයා නිසා ය. යුනෙස්කෝ ආයතනයේ Learning the treasure වාර්තාවට අනුව 21 වන සියවසේ ප්‍රධාන කුළුනු සතරට අනුකූල වන ලෙස ශිෂ්‍යයා සැකසීම අධ්‍යාපනයෙන් සිදු කරයි. එනම්,

- Learning to know (දැනගැනීම උදෙසා ඉගෙනීම)
- Learnig to do (වැඩ කිරීම උදෙසා ඉගෙනීම)
- Learnig to live together (එකට ජීවත් වීම උදෙසා ඉගෙනීම)
- Learning to be (දිවි පැවැත්ම උදෙසා ඉගෙනීම) (යුනෙස්කෝ, 2010: 85-97)

යනුවෙන් දැන ගැනීම උදෙසා ඉගෙනීම (තමන්ට අවශ්‍ය දැනුම තාක්ෂණික මෙවලම් භාවිත කර ලබා ගැනීමේ හැකියාව), වැඩ කිරීම උදෙසා ඉගෙනීම (තමන් නිරත වන කාර්යයට අමතර ව බහුවිධ කාර්යවල නියැළීමේ හැකියාව), එකට ජීවත් වීම උදෙසා ඉගෙනීම (අන්‍ය සංස්කෘතීන් තේරුම් ගනිමින්, ඒවාට ගරු කරමින් අන් මත ඉවසමින්, කණ්ඩායමක් ලෙස එක්ව එකට ඉගෙනීම), දිවි පැවැත්ම උදෙසා ඉගෙනීම (තමා සතු සහජ කුසලතා නමැති නිදන්ගත වස්තූන් කිසිවක් අපතේ නොහැර මතු කොට සංවර්ධනය කර ගැනීම) යන ප්‍රධාන කාර්යන්වලට අනුව පුද්ගලයා සමාජයට අනුගත කරයි. මේ සියල්ලෙහි මෙහෙයුම්කරුවා වන්නේ ගුරුවරයා ය.

කාරියවසම් (2001: 18, 19) දක්වන පහත නිර්වචනයෙන් ද පාසලේ කාර්යභාරය හා ගුරු භූමිකාව කුමක් ද යන්නත් ගුරුවරයා හා සමාජානුයෝජනය අතර සම්බන්ධය කවරාකාර ද යන්නත් පැහැදිලි වේ. 'උසස් ම අධ්‍යාපනය නම් තොරතුරු සපයන අධ්‍යාපනය නොව ජීවන පැවැත්ම සමග සමෝධානය වන අධ්‍යාපනය යි'. ඒ අනුව පාසලේ ප්‍රධාන කාර්යය පුද්ගලයා සමාජයට අනුකූල වන ලෙස සැකසීම බවත් ගුරු කාර්යභාරය ද එය ම බවත් පැහැදිලි වේ. එය පීටර්ස් ඉදිරිපත් කරන 'අධ්‍යාපනය පුද්ගලයා සමාජයට ඇතුළත් කර ගැනීමේ ක්‍රියාවලියකි' (සේනාධීර හා වනසිංහ, 2002: 6) යන නිර්වචනයෙන් ද තහවුරු වේ. ඒ අනුව පුද්ගලයා සමාජානුයෝජනය කිරීම අධ්‍යාපනයේ කාර්යභාරය වන අතර ම එහි ප්‍රධාන නියමුවා ගුරුවරයා බවත් පැහැදිලි වේ.

## සමාජානුයෝජනය විෂයෙහි ගුරුවරයාගේ කාර්යභාරය

සමාජානුයෝජනයේ ප්‍රධාන නියමුවෙකු ලෙස ගුරුවරයා පෙනී සිටින බව උක්ත කරුණුවලින් පැහැදිලි වේ. ඒ අනුව ගුරුවරයා කවරාකාරයෙන් සමාජානුයෝජනයෙහි යොමු වන්නේ ද යන්න විමසීම වැදගත් ය. පාසලේ මෙන් ම පාසලින් පිටත ද ගුරු භූමිකාව මෙහිදී ඉතා වැදගත් ය.

පාසලේ දී විෂයමාලාව හා විෂය බාහිර ක්‍රියාකාරකම් වශයෙන් දෙආකාරයකින් සමාජානුයෝජනයට ගුරුවරයා සම්බන්ධ වේ. එදිනෙදා මුහුණ පෑමට සිදු වන අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීම සඳහා ඔහුගේ නිර්මාණාත්මක හැකියා ප්‍රයෝජනයට ගැනීමට ඉගැන්වීම මෙහි දී සිදු වේ. එමෙන් ම සමාජයේ විවිධ තත්වයන් හා කාර්යයන්වලට අනුගත වීමටත්, සාමූහික විනයකට අනුව කටයුතු කිරීමටත්, නියමිත වෙලාවට වැඩ කිරීමටත්, පරෝපකාරය හා ස්වයං පාලනයට අවකාශ සලසා දීමත් පාසලේ දී ගුරුවරුන් විසින් සිදු කරන කාර්යන් හි ප්‍රතිඵලයක් ලෙස ගොඩ නැගෙන්නක් බව දැක්විය හැකි ය.

එමෙන් ම ගුරුවරයාගේ කාර්යභාරය විමසීමෙන් සමාජානුයෝජනය විෂයෙහි ගුරුවරයාගේ භූමිකාව කවාරාකාර ද යන්න පැහැදිලි වේ. අගාර්වල් විසින් දක්වන 1 වන වගුවෙහි එන භූමිකා පහෙන් එය පැහැදිලි වේ.


| භූමිකාව | අපේක්ෂිත කාර්යය |
|---|---|
| ශිෂ්‍ය සංවර්ධනය | ශිෂ්‍යයාගේ කායික, මානසික, චිත්වේගික හා පෞරුෂ සංවර්ධනයට අවශ්‍ය ක්‍රියාකාරකම් සිදු කිරීම |
| සමාජීය වෙනස්කම්වල නියෝජිතයකු වීම | සමාජයේ සිදු වන ආර්ථික, දේශපාලනික, ආගමික වෙනස්කම් අනුව ශිෂ්‍යයන් හැඩ ගැස්වීම |
| සමාජ සුභ සාධනය පිළිබඳ ව කටයුතු කිරීම | සමාජයේ දියුණුව උදෙසා පුද්ගලයන්ගේ සුභ සාධනය උදෙසා පාසල් මට්ටමේ හා ප්‍රජා මට්ටමින් විවිධ වැඩ සටහන් සංවිධානය |

| | |
|---|---|
| සමාජීය අසහනය හා ගැටුම් සමනය | පුද්ගල කණ්ඩායම් අතර ජාති, ආගම්, කුල ආදි වශයෙන් පවතින විවිධ අසහන දුරු කර, ඇති විය හැකි ගැටුම් අවම කිරීම සඳහා කටයුතු කිරීම |
| ජාත්‍යන්තර අවබෝධය ලබා දීම | ජාත්‍යන්තර වශයෙන්, ඇති වන නව දැනුම ග්‍රහණය කර ගැනීම හා ජාත්‍යන්තර ව සිදු වන විවිධ වෙනස්කම් පිළිබඳ අවබෝධය ලබා දීම |

(සේනාධීර හා වනසිංහ, 2007: 13)

මෙහි දැක්වෙන සියලු භූමිකාවලින් ශිෂ්‍යයා සමාජයට අනුගත කිරීමක් සිදු කරයි. නොපෙනෙන අනාගතයක් සඳහා සූදානම් කරයි. මේ අනුව පැහැදිලි වන්නේ ගුරුවරාගේ සමස්ථ කාර්යභාරය ම සමාජානුයෝජන ක්‍රියාවලියට ඍජු ව සම්බන්ධ වන බව යි.

තව ද අධ්‍යාපනයෙන් සංවර්ධනය වන පුද්ගලයාගේ පූර්ණත්වය සංවර්ධනය කිරීමට ඉගැන්වීම් ක්‍රියාවලියෙන් ගුරුවරුන් විවිධ කාර්යයන් රැසක් ඉටු කරති. මිනිසාගේ පූර්ණ සංවර්ධනය කුමක් ද යන්න පහත රූපයෙන් පැහැදිලි වේ.




(සේනාධීර හා වනසිංහ, 2002: 7)

මේ ආදි වූ පුද්ගල වර්ධනයේ සියලු ම අංශ කෙරෙහි අධ්‍යාපනය වැදගත් වන බව දැක්විය හැකි ය. පුද්ගලයාගේ බුද්ධිමය සංවර්ධනය පමණක් නොව අනෙකුත් සියලු ම අංශවල සංවර්ධනය

සමගින් සමාජයට යහපත් පුද්ගලයෙකු බිහි කිරීමේ අපේක්ෂාවෙන් පාසලේ ගුරුවරු මූලික වී කටයුතු කරති. ඒ අනුව සමාජානුයෝජනයේ දී ගුරුවරයාගේ කාර්යභාරය ශිෂ්‍යයා පූර්ණ සංවර්ධනයක් සහිත ව සමාජ ගත කිරීම බව දැක්විය හැකි ය.

එමෙන් ම ජීවිතය යනු කුමක් ද, ජීවත් වන්නේ ඇයි, ජීවිතය තමාට හා රටට ඵලදායි කර ගනුයේ කෙසේ ද, ජීවිතයට ඇති වන අභියෝග කවරේ ද, ඒවාට මුහුණ දෙනුයේ කුමන ආකාරයෙන් ද ආදි සියල්ල ම උගන්වනුයේ විෂයමාලාව හා විෂය සමගාමී ක්‍රියාකාරකම් ඇසුරු කර ගනිමින් ගුරුවරුන් විසිනි. 'අධ්‍යාපනය යන්න පුළුල්ව ගත් කල අදහස් කරන්නේ මිනිසා උපන් දා සිට මරණය දක්වා ස්වකීය බාහිර සමාජයට හා ආධ්‍යාත්මික පරිසරයට ක්‍රමයෙන් හැඩ ගසන පිළිවෙළයි' (සේනාධීර හා වනසිංහ, 2002: 9) යන ජයසේකර දක්වන නිර්වචයෙන් එය තහවුරු වේ.

අධ්‍යාපනය ලබන්නාට තමන් ජීවත් වන සමාජයේ, තමන්ට හිමි වී ඇති ස්ථානය ලබා ගැනීමටත්, තමන්ගෙන් සමාජයට විය යුතු යුතුකම් වගකීම් සපුරාලීමටත් අවශ්‍ය දැනුම කුසලතා හා ආකල්ප මෙන් ම පුහුණුව ද ගුරුවරු ලබා දෙති. අධ්‍යාපනය පිළිබඳ අදහස් දක්වන ඇතැමෙක් මෙය නිර්වචනය කරනුයේ සමාජය මූලික කර ගෙන ය.

''අධ්‍යාපනය යනු සමාජ යහපත සඳහා කටයුතු කිරීමට හුරු කිරීම යි'' (රුබේරු, 1998: 31)

''අධ්‍යාපනය අනෙකක් නොව සමාජ සංවර්ධන ක්‍රියාවලියකි'' (රුබේරු, 1998: 31)

මෙලෙසින් පැහැදිලි වන්නේ සමාජයට ඉතා වැදගත් කාර්යභාරයක් අධ්‍යාපනයෙන් සිදුවන බව යි.

තව ද පාසල තුළ ගුරුවරයාගේ භූමිකාවේ වැදගත් බව ඩබ්. අයි. තෝමස් (W.I.Thomas) නම් මනෝවිද්‍යාඥයා පෙන්වා දේ. ඔහුට අනුව, ගුරුවරයාගේ පෞරුෂය හා ඉගැන්වීම හරහා එම පෞරුෂ ගුණාංග දරුවා තදාත්මීකරණය කර ගැනීමෙන් තුලනාත්මක

පෞරුෂයක් හිමිකර ගන්නා බව දක්වයි (නාගිත හිමි, 1998, 112). ඒ අනුව ශිෂ්‍යයා සමාජානුයෝජනයෙහි ලා ගුරු මැදිහත් වීම ඉතා ප්‍රබල බව පැහැදිලි වේ.

## සමාජානුයෝජනයේ දී ගුරුවරයා අනුගමනය කරන ක්‍රම ශිල්ප

අධ්‍යාපන ක්‍රියාවලිය යනු සමාජානුයෝජන ක්‍රියාවලිය බව උක්ත ප්‍රකාශ විණි. ඒ අනුව ගුරුවරුන් විසින් කවරාකාර ක්‍රම ශිල්ප සමාජානුයෝජනයෙහි භාවිත කරන්නේ ද යන්න විමසා බැලීම වැදගත් ය. පාසලේ දී සිසුන් සමග කටයුතු කරන ගුරුවරුන් විසින් ශිෂ්‍යයන් සමාජානුයෝජනය කිරීම සඳහා භාවිත ප්‍රධාන ක්‍රම කිහිපයකි.

- විෂයමාලාව
- විධිමත් විෂයමාලාව

පාසලේ නිර්දිෂ්ට පොත පත ඇසුරින් ගුරුවරුන් විසින් ලබා දෙනුයේ විධිමත් විෂයමාලාවට අනුකූල වූ අධ්‍යාපනය යි. එම විෂයමාලාව රට පුරා ව්‍යාප්ත ව පවතින සියලු පාසල්වල ක්‍රියාත්මක වේ. ප්‍රාථමික අධ්‍යාපනයේ ඒ ඒ වසර සඳහා (1 වසර සිට 5 වසර දක්වා) විෂයමාලා ද, ද්විතීයික අධ්‍යාපනය සඳහා (6 වසර සිට 13 වසර දක්වා) ඒ ඒ වසරවලට වෙනත් විෂයමාලා ද වශයෙන් විෂයමාලාව විවිධ වේ. එයින් ශිෂ්‍යයන් රටට, ලෝකයට, සමාජයට වැඩදායී, නවීන ලෝකයට අනුගත වූවකු බවට පත් කරනු ලබයි.

විෂය සමගාමී ක්‍රියාකාරකම් ද විධිමත් විෂයමාලාවෙහි ලා ගැනිය හැකි ය. එහි දී විෂයමාලාවට අනුගත ව ඒ හා සම්බන්ධ ප්‍රායෝගික ක්‍රියාකාරකම් සැලසුම් කරමින් විෂය දැනුම ලබා දීම සිදු කරයි.

## අවිධිමත් විෂයමාලාව

විධිමත් විෂයමාලාවෙන් වෙන් වූ පාසල්වල ක්‍රියාත්මක වන විෂය බාහිර ක්‍රියාකාරකම් මෙයට අයත් වේ. ක්‍රීඩා උත්සව, ශ්‍රමදාන, සමාජ සේවා ආදිය ඉන් කිහිපයකි. මෙම විෂයමාලාවල ශිෂ්‍යයා නායකත්ව පුහුණු, සමගිව කටයුතු කරන ආකාරය, කණ්ඩායම්

හැඟීම, අනේකාට උපකාර කිරීමේ චින්තනය ආදි වශයෙන් පෞරුෂත්ව වර්ධනය වන ආකාරයේ ක්‍රියාකාරකම් අන්තර්ගත වේ. ඒවා සැලසුම් කොට ක්‍රියාත්මක කිරීම ගුරුවරුන් විසින් සිදු කරනු ලැබේ.

## සැඟවුණු විෂයමාලාව (Hidden curriculum)

සැඟවුණු විෂයමාලාව (Hidden curriculum) යනු පාසලේ සැඟවී ඇති විවිධ නීතිරීති, අගයයන්, සාරධර්ම, සංස්කෘතිය ආදිය යි. පාසල තුළ අඳින පළඳින ආකාරය, හැසිරෙන ආකාරය, කතා විලාසය ආදි සියල්ලක් ම සැඟවුණු විෂයමාලාවට අයත් වේ. පාසලට පැමිණෙන ශිෂ්‍යයා එම සැඟවුණු විෂයමාලාවට අනුගත ව කටයුතු කරන්නේ ද යන්න විමසා බලා ඒ අනුව හැඩ ගැස්වීම ගුරුවරුන් විසින් සිදු කරනු ලබයි. ඒ අනුව ශිෂ්‍යයා තුළ නිරායාසයෙන් ම තම අභ්‍යන්තර චර්යා ගොඩ නගාගනී.

මෙම ක්‍රමවේද ඔස්සේ ශිෂ්‍යයා රටට, සමාජයට වැඩදායී පුද්ගලයෙක් බවට පත් කිරීමට ගුරුවරු උත්සාහ ගනිති. එමෙන් ම ගුරුවරුන් විසින් භාවිත කරන තවත් සමාජානුයෝජන ශිල්ප ක්‍රම කිහිපයක් ද දැකිය හැකි ය.

### ආදර්ශය

සමාජානුයෝජනය සඳහා භාවිත කරන තවත් එක් ශිල්ප ක්‍රමයක් ලෙස ආදර්ශය සඳහන් කළ හැකි ය. ගුරුවරයා පාසල තුළ ඇඳීම, පැළඳීම, කතා කිරීම, හැසිරීම, අන්‍යයන් සමග ගණුදෙනු කිරීම ආදිය සිදු කරමින් ශිෂ්‍යයාට ආදර්ශමත් ආකාරයෙන් කටයුතු කරන්නට අවස්ථාව ලබා දේ. ශිෂ්‍යයින් ද තම චර්යා රටාවන් දකින අසන දේ අනුව සකසා ගැනීමට උත්සුක වන නිසා ආදර්ශය ඉතා වැදගත් බව දැක්විය හැකි ය. එය සවිඥාණික ව හා අවිඥාණික ව ද ගොඩ නැගිය හැකි නිසා ඉතා වැදගත් ශිල්ප ක්‍රමයක් ලෙස දැක්විය හැකි ය. වීර චරිත, වීර කතා පිළිබඳ ප්‍රකාශ කිරීමෙන් ද සිදු කරනුයේ මෙම ආදර්ශයන් ශිෂ්‍යයාට ලබා දීමයි.

**අනුකරණය**

මෙම ශිල්ප ක්‍රමයෙන් ශ්‍රේෂ්ඨ චරිතවල ඇති යහපත් ගුණාංග අනුකරණය කරමින් සමාජානුයෝජනයට යොමු කරයි. නිදසුනක් ලෙස අනගාරික ධර්මපාලතුමාගේ චරිත කතාව පැහැදිලි කරමින් අනුකරණය කිරීම සඳහා සිසුන්ට එම චරිතය හඳුන්වා දීම ආදියෙන් එම චර්යා රටා ශිෂ්‍යයාගේ අභ්‍යන්තරීකරණය කිරීම සිදු කරයි. මේ ආදි වශයෙන් අනුකරණ ක්‍රමවේද ගුරුවරුන් විසින් ශිෂ්‍ය සමාජානුයෝජනය සඳහා අනුගමනය කරනු ලබයි.

**උපදේශනය/ඉගැන්වීම්**

ගුරුවරුන් විසින් ශිෂ්‍යයන්ට යමක් කළ යුතු ආකාරය හා නො කළ යුතු ආකාරය පිළිබඳ උපදෙස් දීම, තම චර්යාව සකසා ගත යුතු ආකාරය පිළිබඳ ඉගැන්වීම, අනුගමනය කළ යුතු ආචාර ධර්ම ආදිය ඉගැන්වීම සිදු කරනු ලබයි. විෂයමාලාව තුළින්, විෂය සමගාමී ක්‍රියා, විෂය බාහිර ක්‍රියා, වාචික ව හෝ ක්‍රියාකාරකම්වලින් උපදෙස් දීම, ඉගැන්වීම, අඩුපාඩු පෙන්වා දීමෙන් සිසුන් සමාජයට අනුගත කරනු ලබයි.

**ත්‍යාග**

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ දී ගුරුවරුන් විසින් ශිෂ්‍යයා සමාජානුයෝජනය කිරීමෙහි ලා අනුගමනය කරන ක්‍රමයක් ලෙස ත්‍යාග හැඳින්විය හැකි ය. ත්‍යාග ලබා දීම යනු මානසික හෝ භෞතික ව මනස සුවපත් වන ආකාරයේ කටයුතු කිරීමයි. මානසික සහනය ගෙනෙන ත්‍යාග ලෙස යහපත් ක්‍රියාවක් සිදු කළ පසු අත්පුඩියක් ගැසීම, 'හොඳයි, ඉතා හොඳයි' ආදි වශයෙන් වාචික ව ප්‍රකාශ කිරීම දැක්විය හැකි ය. භෞතික ත්‍යාග යනු යහපත් ක්‍රියාවක් කළ පසු යම් ද්‍රව්‍යයක් ලබා දීමයි.

මෙම ත්‍යාගයෙන් සිදු කරනුයේ ශිෂ්‍යයාගේ යහපත් ක්‍රියා අනුමත කිරීමකි. එමගින් ධනාත්මක උපස්ථම්භනය සිදු වන අතර එවැනි යහපත් ක්‍රියාවල තවදුරටත් නියැළීමට ශිෂ්‍යයා උනන්දු වේ.

**දඬුවම්**

ශිෂ්‍යයාගෙන් ප්‍රකාශ වන යම් වැරැද්දක් නිරුද්ධනය සඳහා සෘණාත්මක උපස්ථම්භනයක් ලෙස දඬුවම ක්‍රියාත්මක කෙරේ. එහි දී ගුරුවරු මානසික දඬුවම හා කායික දඬුවම ලෙසින් දෙආකාරයකින් දඬුවම භාවිත කරති. වැරදි ක්‍රියාවක් සිදු කළ හොත් බැනීම හෝ කායික ව දඬුවම් කිරීම ගුරුවරු අනුගමනය කරති. ඒ තුළින් තම චර්යාව නිසි පරිදි සකසා ගනිමින් සමාජයට උචිත පුද්ගලයෙකු ලෙස ශිෂ්‍යයා සැකසෙයි. එමිල් ඩුර්කයිම් අනුව 'සමාජයක් විසින් පිළිගෙන, ඇති කර ගෙන තිබෙන දණ්ඩන, අනුමැති සැලසුම් හේතු කොට ගෙන සමාජයට අනුගත පුද්ගලයෙකු ලෙස හැඩ ගැසීමේ ක්‍රියාවලිය සමාජානුයෝජනයයි' (ගලගමගේ, 2019: 43) යන ප්‍රකාශය හරහා දඬුවම සමාජානුයෝජනය සඳහා භාවිත උපක්‍රමයක් ලෙස තහවුරු වේ. චර්යාවාදී ගුරු කුලය අනුව ද පාරිතෝෂණ හා දඬුවම්වල ප්‍රතිඵලයක් ලෙස සමාජානුයෝජනය හඳුනා ගනී (ගලගමගේ, 2019: 43). ඒ අනුව ගුරුවරුන් විසින් දඬුවම සමාජානුයෝජන ශිල්ප ක්‍රමයක් ලෙස භාවිත බව තහවුරු වේ.

මේ ආදි වශයෙන් ගුරුවරුන් විසින් පාසලේ විවිධ සමාජානුයෝග ශිල්ප ක්‍රම අනුගමනය කරමින් සමාජානුයෝජන ක්‍රියාවලියේ යොමු වන බව දැක්විය හැකි ය.

**සමාජානුයෝජන ක්‍රියාවලියේ දී මතු වන සමාජ ගැටලු හා ගුරු භූමිකාව**

සමාජානුයෝජනයේ දී ගුරුවරුන්ට මුහුණ දීමට සිදු වන සමාජ ගැටලු රාශියකි. ඉන් කිහිපයක් ලෙස,

- සියදිවි හානි කර ගැනීමට තැත් කිරීම,
- අපචාරී ක්‍රියා (ලිංගික/ මත් ද්‍රව්‍ය),
- ජනවාර්ගික අර්බුද,
- ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පිළිබඳ ගැටලු,

- සංස්කෘතික පරිහානිය,
- වාණිජත්වය තුළින් කාමුක අපරාධවලට යොමු වීම,
- අසංවර විලාසිතාවලට යොමු වීම,
- අයෝග්‍ය පරිභෝජන රටාවලට හුරු වීම (ආයතනික සංවර්ධන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, 2010: 31)

ආදි වූ ගැටලුවලට මුහුණ දීමට ගුරුවරයාට සිදු වන අතර ඒ සඳහා විවිධ ක්‍රම අනුගමනය කළ යුතු ය.

ශිෂ්‍යයාගේ මානසිකත්වය වර්ධනය කිරීම, යහපත අයහපත පැහැදිලි කිරීම හා සුභාසුභ තෝරා ගන්නා ආකාරය පැහැදිලි කිරීම, දරා ගැනීමේ හැකියාව ආදිය වර්ධනය කිරීම, මිතුරු මිතුරියන් අතර සුහදත්වය වර්ධනය කිරීම සඳහා විවිධ ක්‍රියාකාරකම්වලට යොමු කිරීම, මානසික ආතතිය අවම කිරීම සඳහා විවිධ ක්‍රම අනුගමනය කිරීමට හුරු කිරීම ආදිය මගින් ගුරුවරයාට මෙවැනි සමාජ ප්‍රශ්නවලට ශිෂ්‍යයා සූදානම් කිරීමේ හැකියාව ඇත. එයින් ගුරුවරයාට එවැනි සමාජ ප්‍රශ්නවලින් ශිෂ්‍යයා මුදවා ගැනීමට හැකි වේ.

**සමාජානුයෝජනය විෂයෙහි ගුරු භූමිකාවේ අවශ්‍යතාව**

සමාජයේ පුද්ගල පැවැත්ම තහවුරු කර ගැනීමට හා සමාජයේ ප්‍රගමනය උදෙසා සමාජානුයෝජනය අත්‍යාවශ්‍ය ය. එයින් තොර ව ජීවත් වීම පුද්ගලයාට මෙන් ම සමාජයට ද බාධාවකි.

සමාජානුයෝජනය නොවීම නිසා ඇති වන ගැටලුකාරී අවස්ථා හා එවැනි පුද්ගලයින්ගේ ලක්ෂණ දෙස අවධානය යොමු කිරීමේ දී සමාජානුයෝජනයේ අවශ්‍යතාව මනා ව පැහැදිලි වේ. ඒ අනුව, සමාජානුයෝජනයට ලක් නො වුණු පුද්ගලයකු තුළ දැකිය හැකි ලක්ෂණ කිහිපයක් වේ. එනම්,

A. සංස්කෘතිය, සාරධර්ම, විශ්වාස ආදිය පිළිබඳ අවබෝධයක් නොවීම,

B. සාමාජීය වශයෙන් පුද්ගලයාට හිමි වන තත්ත්වයන් හා කටයුතු කොටස් ගැන අවබෝධයක් නොවීම හා ඒ හෙයින් ම කාර්යභාරය ඉටු කිරීමට සමත් නොවීම,

C. සංස්කෘතික සංකේත පිළිබඳ අවබෝධයක් නොවීම,

D. මහා සමාජයේ පවත්නා සංස්ථා ජාලයට (පවුල, පාසල, ආගම, අධ්‍යාපනය) නිසියාකාර ව අනුකලනය වීමට දුෂ්කර වීම (Clausen, 1968: 47) ආදිය යි.

මෙවැනි අසමත්කම් දක්වන පුද්ගලයින්ගෙන් සමන්විත සමාජය අගතිගාමී වන අතර එවැනි පුද්ගලයින්ට ද තම පැවැත්ම ඉදිරියට ගෙන යාම අසීරු ය. ඒ අනුව එයින් පුද්ගලයා මුදවාලීම සඳහා සමාජානුයෝජනයේ අවශ්‍යතාව මනා ව පැහැදිලි වේ.

මීට අමතර ව සමාජානුයෝජනයේ අවශ්‍යතා රාශියක් හඳුනා ගත හැකි ය.

- සාමාජීය පුද්ගලයෙකු බවට පත් කිරීම
- නිවැරදි පෞරුෂයක් ගොඩ නැංවීම
- විනය ගරුක හා නීති ගරුක පිරිසක් නිර්මාණය කිරීම
- සමාජය අඛණ්ඩව පවත්වා ගෙන යාම
- සංස්කෘතිය පවරා දීම
- සමාජ දූරස්ථභාවය අවම කිරීම
- ජීවන රටාව දිශානතිගත කිරීම හා පහසු කරවීම
- අනාගත භූමිකාවන් ඉදිරිපත් කිරීමට පුහුණු කිරීම හා නිපුණතා ඇති කිරීම
- ස්වීයත්වය වර්ධනය වීම
- පැවැත්ම ස්ථාවර ව හා පහසුවෙන් පවත්වා ගෙන යාම
- භෞතික, සමාජයීය, චිත්තවේගික හා බුද්ධිමය වශයෙන් සහාය ලබා ගැනීම

- සදාචාර ගුණාංග හා අගයන් වර්ධනය කිරීම
- මානසික ආතතිය හා අසහනය අවම කිරීම
- විවිධ පුද්ගල හා සමාජ භූමිකා අර්ථකථනයට උදව් වීම
- පුද්ගල හා සමාජ ප්‍රගමනයට හේතු වීම
- සමාජයේ ගැටුම් අවම වීම (ජාතිවාදී, ආගම්වාදී ගැටුම්)
- සමාජ ප්‍රශ්න අවම වීම (සිය දිවි නසා ගැනීම්, දූෂණ, වංචා, හොරමැරකම්)
- සමාජ වාතාවරණය අනුව හැඩ ගැසීම

වශයෙන් සමාජානුයෝජනය කිරීමේ අවශ්‍යතාව මනා ව පැහැදිලි වේ. එය වර්ධනය කිරීමේ වගකීම ප්‍රධාන වශයෙන් පාසලේ දී ගුරුවරයාට පැවරේ. සමාජානුයෝජනය නොවීමෙන් උක්ත කරුණුවල විරුද්ධ ස්වරූපයන්ට මුහුණ දීමට සිදු වේ. එසේ වුව හොත් සමාජයේ අපගමනයට මෙන් ම මානව වර්ගයාගේ අගතියට ද එය හේතු විය හැකි ය. එම නිසා සමාජානුයෝජනය ඉතා අත්‍යවශ්‍ය වූවක් බවත් ඒ සඳහා ගුරු භූමිකාව ද ඉතා වැදගත් බවත් පැහැදිලි වේ.

**සමාලෝචනය**

මෙම ලිපියෙන් පැහැදිලි වනුයේ ගුරුවරයා සමාජානුයෝජනයෙහි ලා කටයුතු කරන ආකාරයයි. එහි දී ගුරු භූමිකාව ඉතා විශාල පරාසයක පැතිරී පවතින බවත් එම සමස්ථ භූමිකාව ම සමාජානුයෝජන භූමිකාවක් බවත් පැහැදිලි වේ.

පාසලේ ඇති විචල්‍ය අතර ගුරුවරයාට හිමි වනුයේ සුවිශේෂ ස්ථානයකි. ඒ අධ්‍යාපනය නම් සමාජානුයෝජන ක්‍රියාවලියේ ප්‍රධාන නියමුවා ගුරුවරයා වන නිසා ය. අධ්‍යාපනය යනු සමාජානුයෝජනය බව ද උක්ත ලිපියේ දී සසාධක ව තහවුරු වූ අතර ඒ අනුව ගුරුවරයාගේ සමස්ත කාර්යභාරය ම ශිෂ්‍යයා සමාජානුයෝජනය කිරීමක් බව පැහැදිලි වේ.

සමාජයට අනුගත ව ජීවත් වීම සඳහා එහි ඇති නීතිරීති, සාරධර්ම, අගයයන් ආදිය ඉගෙනීම සමාජානුයෝජනයයි. ඒ සඳහා ශිෂ්‍යයා මෙහෙයවීම ගුරුවරුන් විසින් සිදු කරනු ලබයි. ඒ අනුව සමාජානුයෝජනයේ ප්‍රධාන නියමුවෙකු ලෙසින් ගුරුවරයා සිදු කරන කාර්යභාරය ඉතා විශාල ය. රටට, ලෝකයට වැඩදායී වන ආකාරයේ ශිෂ්‍යයන් බිහි කිරීම උදෙසා පාසලේ දී මෙන් ම පාසලින් පිටත දී ද විශාල මෙහෙවරක ගුරුවරයා යෙදෙයි. ඒ සඳහා අනුකරණය, ත්‍යාග ලබා දීම, දඬුවම් කිරීම, උපදේශනය ආදිය යොදා ගනිමින්, විධිමත් විෂයමාලාව, අවිධිමත් විෂයමාලාව හා නොවිධිමත් විෂයමාලාව ප්‍රධාන කොට ගනිමින් සමාජානුයෝජනයෙහි ලා ගුරුවරුන් උත්සුක වන බව උක්ත කරුණු අනුව පැහැදිලි වේ.

මේ අනුව සමස්තයක් ලෙසින් අවධානය යොමු කිරීමේ දී පැහැදිලි වන්නේ සමස්ත අධ්‍යාපන ක්‍රියාවලිය ම සමාජානුයෝජනයක් වන හෙයින් ගුරුවරයාගේ සමස්ත භූමිකාව ම සමාජානුයෝජනය සමග නිතර ම සබැඳි වූවක් ලෙසින් ගම්‍ය වන බව යි.

## ආශ්‍රිත මූලාශ්‍ර නාමාවලිය

අමරසේකර, දයා. (1996). *ශ්‍රී ලංකා සමාජය.* ආරිය ප්‍රකාශකයෝ. වරකාපොල.

ආයතනික සංවර්ධන දෙපාර්තමේන්තුව. (2010). *අධ්‍යාපන මූලධර්ම හා පාසල් කළමනාකරණය අත්පොත.* ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.

කාරියවසම්, සී. (2001). *නව අධ්‍යාපන මූලධර්ම.* සමයවර්ධන පොත්හල. මරදාන.

ගලගමගේ, එස්. (2019). *අධ්‍යාපනයේ සමාජ විද්‍යාත්මක පදනම.* කර්තෘ ප්‍රකාශනයකි.

ජයසේන, අශෝකා (2003). *ප්‍රවීණ වෘත්තිකයෙකු වීම සඳහා ඉගැන්වීමේ ක්‍රම.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.

නාගිත හිමි, මහපුලියන්කුලමේ (1998). *සමාජ විද්‍යාවේ මූලිකාංග.* කර්තෘ ප්‍රකාශනයකි.

රුබේරු, රංජිත් (1998). *නව අධ්‍යාපන සංකල්ප.* ප්‍රකාශක සඳහන් නොවේ.

සේනාධීර, සිල්වි හා වනසිංහ, ශාමින්ද (2005). *ශිෂ්‍ය නිර්මාපී බව වර්ධනය සඳහා පාසල් අධ්‍යාපනය සැලසුම්කරණය.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.

සේනාධීර, සිල්වි හා වනසිංහ, ශාමින්ද (2002). *ශ්‍රී ලංකාවේ අධ්‍යාපන සැලසුම්කරණය සඳහා දාර්ශනික මාර්ගෝපදේශ.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.

සේනාධීර, සිල්වි හා හේවාපතිරණ, චිත්‍රාංගනී (2006). *ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා ගුරු නිපුණතා.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.

Clausen, John A. (ed.). ( 1968). *Socialization and Society.* Little Brown and Company, Boston.

Elkin, F. (1960). The child and Society: *The process of socialization.* Random House, New york.

Merill Francis, E. (1961). *Society and Culture,* Engriewood Cliffs, New Jersey Prentice Hall.

Unesco (2010). *'Learning: The treasure within' report,* Unesco publishing.